# නර්තනය - 10 ශ්‍රේණිය

## (පළමු වාරය )



The National e-learning Portal for the General Education

# හෝමාගම අධ්‍යාපන කලාපය
# ස්වයං අධ්‍යයන ඉගෙනුම් අත්වැල
# නර්තනය
# 10 ශ්‍රේණිය

ඒකකය - **4.1.1.** නිර්දිෂ්ට ජන කවි ගායනාවල පසුබිම විස්තර කරමු
පැවරුම් අංක - **02**

- **ජන කවි යනු ,**
  - ජනතාව අතරේ ම ඇති වී ඔවුන් අතරේම ආරක්ෂා වී පැවත කවි කවි ජන කවි ලෙස හැඳින්වේ
  - ජන කවි වල ලක්ෂණ
  - කතුවරයෙකු නොමැතිවීම
  - මොවුන්ගේ ජීවන වෘත්තීන් හා බැඳී පැවතීම

    උදා :- ගොයම් ,පැල්
    පතල්, ගැල්
  - ජනයාගේ දිවියට බෙහෙවින් සමීප අදහස් ජන කවි ලෙස නිර්මාණය වීම

**බුදුන් ට දෙවියන්ට ඇති භක්තිය**

උදා :- **i.** උදයට පායන හිරු දෙවියන්ටයි ..............
**ii.** වාරම් වාරම් ඉර සඳ දෙවි අතින්..............
**iii.** බුද්ධං සරණේ සිරස දරා දරා ගෙන..............

**දුක් කම් කටොලු**

උදා :- **i.** පතල් කවි
ඉන්නේ දුම්බරයි මහා කලු ..............
**ii.** පැල් කවි
දුප්පත් කමට ගොන් බැඳගෙන දක්කනවා.

**විනෝදාස්වාද**

උදා :- කළ ගෙඩි කවි (වතේ ඒ පුන් සඳ )
ගොයම් කවි (උඩහා ගෙදර රං කිරි )

## <u>වන්නම් වල සංස්කෘතික පසුබිම</u>

- ගායනය සඳහා රචනා වී ඇත
- සම්ප්‍රදායන් තුනට ම තුනටම පොදු වූ අංගයකි
- උඩ රට හා සබරගමු වන්නම් විනෝදාස්වාදය සඳහා ද පහත රට වන්නම් ආගමික භක්තිය මුල් කොට ගෙන නිර්මාණය වී ඇත .
- දෙවියන් විවිධ වස්තූන් සිද්ධි**,**මනං කල්පිත දේවල් ආදිය පිළිබඳ වන්නම් වලින් වර්ණනා විස්තර කෙරේ.
- මෙම වන්නම් පසු කාලයේ නර්තනය සඳහා යොදා ගෙන ඇත

උදා:- උඩරට වන්නම්
සිංහරාජ වන්නම
සැවුලා වන්නම

# <u>රබන් කවි</u>




- දේශීය අවනද්ද භාණ්ඩයකි.
- එක් මුහුණතක් ඇත.
- එකැස් බෙරය නමින්ද හඳුන්වයි.
- ආතත ඝනයට අයත්ය.

රබන් වර්ග

| බංකු රබාන | විරිඳු රබාන | කරකවන රබාන | අත් රබාන |
|---|---|---|---|
|  |  |  |  |
| **i.**අවුරුදු සමයේ<br>**ii.**මංගල උත්සවවල<br>**ii.**පෙරහැර වල වාදනය කරයි. | **i.**විරිඳු ගායනයට | **i.**නර්තන අංගයන් සඳහා | **i.**සුවිසිවිවරණ |

❖ රබාන විනෝදාස්වාදය, පූජාර්ථය, සන්නිවේදන අවස්ථා සඳහා යොදා ගන්නා රබන් නර්තනය සඳහා රබන් කවි යොදා ගනී.
උදා:- නන් උතුම් පෙම්බර ගුණ රුසිරු රබානා

# චාමර කවි

- පවන් සැලීම හෙවත් සෙමෙර සැලීම ඇසුරින් නිර්මාණය වූ කවි විශේෂයකි.
- රාජ සභාව ඇසුරින් බිහි වී ඇත.
- ගැමි ජීවිතය හා බැඳි නොපැවතීම නිසා අතීතයේ බුද්ධ, දේව, රාජ ප්‍රශස්ති යොදා ගෙන ඇත.

ජය ජය සිංහ නරේන්ද්‍රා - රක්ෂ රක්ෂ
ජය ජය සිං සුරේන්ද්‍රා
ජය ජය සිංහ සුරේන්ද්රා - රක්ෂ රක්ෂ
ජය ජය කන්ද සුරින්දා

- පසු කාලීනව විවධ නාද මාලා තාලරූප අනුව කවිද නිර්මාණය කොට ඇත.




නියඳ කෙඳි යොදාගනී

# ඔන්චිලි වාරම් කවි.



- අවුරුදු කාලයේ ජන ක්‍රීඩාවක් ආශ්‍රයෙන් බිහිවී ඇත.
- විනෝදාස්වාදය සඳහා ඔන්චිලි වාරම් ගායනය කරයි.
- වයස් සීමාවක්, ගැහැණු, පිරිමි භේදයක් නොමැත.
- සාමූහික ජන ක්‍රීඩාවක් වන අතර සතුට, දරා ගැනීම, අභියෝගවලට මුහුණ දීම ආදී හැකියාවන් ප්‍රදර්ශනය කරයි.
- ඔන්චිලි වාරම් ආසාතාත්මක අනාසාතාත්මක ලෙස ගායනය කරයි.
- ගුණ තුන් සරණේ කවි භාවිතා කරයි.

    ඉහළට යනකොට පපුවයි දන්නේ
    පහළට හනකොට නිවිලයි එන්නේ
    පොල්ලක් පැත්තට පුදුම නොවන්නේ
    පත්තිනි දෙවියෝ අප රැක දෙන්නේ

- ඔන්චිලි වර්ග - කතුරු ඔන්චිල්ලා , කුඩු ඔන්චිල්ලා
  රුහැන් ඔන්චිල්ලා ,බඹර ඔන්චිල්ලා
  වැලි ඔන්චිල්ලා ,කඹ ඔන්චිල්ලා

## **නමස්කාර ගායනා**

- ත්‍රිවිධ රත්නය කෙරේ ගෞරව පෙරදැරිව ගායනා කරයි.
- පාලි භාෂාවෙන් ලියා ඇත.
- විලම්භ ලයෙන් අනාසාතාත්මකව ගායනා කරයි.
- දේශීය ශාන්ති කර්ම ආරම්භයේදී නමස්කාර ගාථා ගායනය සුවිශේෂී ලක්ෂණයකි.

උදා:- සම්මා සම්බුද්ධ ඥාණෙන -සම්මා සම්බුද්ධ දේසනා
සම්මා සම්බුද්ධ ලොකස්මිං - සම්මා සම්බුද්ධ තේ නමෝ

## **ටීකා සීපද**

- ගද්‍ය පද්‍ය ලක්ෂණ වලින් යුත් ගායනා විශේෂයක් නිසා ටීකා සීපද නම් වේ.
- ආසාතාත්මක හා අනාසාතාත්මක යන ලක්ෂණ දෙකම භාවිත වේ.

  උදා:- ටීකාව (අනාසාතාත්මක)

  තවද ඌරන්ට, ගොනුන්ට, මුවන්ට, හාවුන්ට වෙඩි තියන්නට වල්පාරක් දිගේ.

  සීපදය

  හෙමින් හෙමින් මම ගේකට යන කලට.
- හාස්‍ය උත්පාදනය, උපහාසාත්මක බව, විනෝදාස්වාදය අරමුණු කොට ගෙන ඇත.

# කාර්ය පත්‍රිකා

**I.**ජන කවිය යන්න හඳුන්වන්න.
**II.**ජන කවිවල ලක්ෂණ 2ක් ලියන්න.

..........................................

..........................................

**III.**උඩරට වන්නම පිළිබඳ වාක්‍ය 3ක් ලියන්න.

..........................................................................................

..........................................................................................

..........................................................................................

**IV.**ඔන්චිලි පැදීමේදී පුද්ගලයන් තුල ගොඩනැගෙන පෞරුෂ වර්ධන ලක්ෂණ මොනවාද**?**
**V.**එක් මුහුණතක් ඇති වාද්‍ය භාණ්ඩයක් නම් කරන්න.
**VI.** පූජාර්ථය සඳහා අත් රබාන භාවිතාවන අවස්ථා 2ක් ලියන්න.
**VII.** ගද්‍ය හා පද්‍ය කොටස් ඇතුලත් ගායනා විශේෂය කුමක්ද**?**
**VIII.** ඔබ දන්නා නමස්කාර ගාථාවක් ලියන්න.
**IX.** වන්නම්**,** රබන්**,** ඔන්චිලි**,** චාමර**,** ටීකා**,** නමස්කාර යන ගායනා අනාගාතාත්මක ආගාතාත්මක ලෙස වෙන් කරන්න.